ර/බල/කහටපිටිය හපුගහකුඹුර විද්‍යාලය
එන්.එම්. තුෂාරා හේමන්ති සෙනෙවිරත්න

| තෙවන වාර පරීක්ෂණය 2021 | 7 ශ්‍රේණිය |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | පැය දෙකයි |

නම/ විභාග අංකය........................................................................................................

1 කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

**පහත වැකිවල රූඩී වලට යටින් ඉරක් අඳින්න.**

1. මාගේ ප්‍රතිඵල ඇසූ අම්මාගේ ඉහේ මලක් පිපුණා සේ පෙනුණි.

2. තාත්තා කුකුළා අතින් අරගෙන කුඹුරට ගියබව සීයා මට කීවේය.

3. ''ඉඟුරු දී ................. ගත්තා වගෙයි" ප්‍රස්තාව පිරුළේ හිස් තැනට සුදුසු පදය වන්නේ

   I ගම්මිරිස් II කහ III මිරිස් IV සූදුරු

4. සිංහල අක්ෂර මාලාවේ ව්‍යංජන අක්ෂර...........................

   I 18 කි II 10කි III 25කි IV 42කි

5. සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු පදය තෝරන්න.

   I හොඬ II ළමයා III ගඟ IV දඹ

6. කමත් භාෂාවේ 'රස බෝය' යනුවෙන් හඳුන්වන්නේ

   I හකුරුය II තේ කහටය III කෝපිය IV ආප්පය

7. පොදු ව්‍යවහාරයේ එන 'හිරමනය' අභිකුණ්ඨික ජනයා විසින් හඳුන්වනේ..................... නමිනි.

   I ඉරමන් II පිපෙට්ටි III මස්කත් IV පේලාව

**හිස්තැන් වලට සුදුසු උක්ත ආඛ්‍යාත පද තෝරන්න**

8. ........................ඉක්මන් ගමනින් විහාරයට ගියාය.
   (උපාසිකාව/ උපාසකයා)

9. .......................දිවා රෑ නොබලා රෝගීන් සුවපත් කරති.
(වෛද්‍යවරු/ වෛද්‍යවරයා)

10. නංගී මිහිරි ගීතයක් ගායනා.......................
(කරන්නේය/ කරන්නීය)

11. තරු පෙළ රාත්‍රී අහසේ.......................
(දිස්වෙති/ දිස්වෙයි)

12. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරන්න.

සඳ ඃ-

I චන්ද්‍රයා II තරුපති III දිවාකර IV සිසි

13. පහත දැක්වෙන වචන වලින් මහාප්‍රාණ අක්ෂර යෙදී නැති වචනය තෝරන්න.

I වර්ධනය II අභ්‍යාසය III ශිෂ්‍යයා IV සංඛ්‍යා

**ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය තෝරන්න.**

14. මම හිමිදිරියේම <u>නැගිට</u> පාඩම් වැඩ කළෙමි.

I පූර්ව ක්‍රියා II මිශ්‍ර ක්‍රියා III ආශිර්වාද ක්‍රියා IV විධික්‍රියා

15. අක්කා ගීතයක් <u>කියමින්</u> නැටුමක් නැටුවාය.

I පූර්ව ක්‍රියා II මිශ්‍ර ක්‍රියා III ආශිර්වාද ක්‍රියා IV විධික්‍රියා

16. දී ඇති පද අතුරින් නාම විශේෂණ පදය වන්නේ

I රතු රෝස II අරලිය III ඇන්තූරියම් IV ඩේලියා

17. කෝමල රේඛා පද්‍ය පන්තිය රචනා කරන ලද්දේ

I මුනිදාස කුමාරතුංග මහතා විසිනි.

II චන්ද්‍රරත්න මානවසිංහ මහතා විසිනි.

III ඇස් මහින්ද හිමි විසිනි.

IV එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසිනි.

18. දී ඇති පද අතුරින් අනුක්ත පදය වන්නේ

I මම II ඔවුහු III තොපි IVගුරුවරුන්

19. හිම කුමරිය, රත්මලී, වලස් පවුල ආදී නාට්‍ය නිර්මාණය කරන ලද්දේ

I ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා විසිනි.

II සෝමලතා සුබසිංහ මහත්මිය විසිනි.

III මොණිකා රුවන්පතිරණ මහත්මිය විසිනි.

IV මුණිදාස කුමාරතුංග මහතා විසිනි.

20. සමන්ත කූඨය....................................... දෙවියන්ගේ වාසභූමියක් සේ සැලකෙයි.

I විෂ්ණු II කතරගම III සමන් IV නාථ

**ලකුණු 2 බැගින්** 2x20 **=40**

**2 කොටස**

**පළමුවන ප්‍රශ්නය, දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු ලියන්න.**

1. ''තිලමුට්ඨි ජාතකය" පාඩමෙන් ඔබ පන්තිකාමරයේදී කළ ක්‍රියාකාරකම් ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I මෙම පාඩමට අදාළව ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ ක්‍රියාකාරකම කුමක්ද?

II එම ක්‍රියාකාරකම සඳහා යොදාගත් සම්පත් 4ක් ලියන්න.

III මේ සදහා උපදෙස් ලබාදුන් පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

IV ක්‍රියාකාරකම සඳහා ඔබ තොරතුරු ලාබාගත් මූලාශ්‍ර 2ක් ලියන්න

V ක්‍රියාකාරකම සිදු කිරීමේදී ඔබට ඇතිවූ ගැටලු 2ක් ලියන්න.

VI ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකම තුළින් ලැබුණු ප්‍රයෝජන 2ක් ලියන්න.

**(ලකුණු 15)**

2. පහත මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.

I වැඩිහිටියන් රැකබලා ගනිමු.
II සිය රට දේ සිරි සැප දේ.
III පූජ්‍ය වැලිවිට සරණංකර හිමි.
IV සුන්දර හෝර්ටන් තැන්න.

V කොරෝනා වසංගතය මෙරටින් තුරන් වේ නම්...

(ලකුණු 15)

3. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**මේ ආකාරයෙන් අද ගුවන්විදුලියෙන් කෙරෙන්නේ එදා සිංහල රජ්ජුරුවන්ගේ කාලයෙහි අඬබෙරයෙන් සිදුවුණු කාරියමය. එදා අඬබෙරයෙන් කෙරුණේ යම්කිසි සිද්ධියක් විශාල පිරිසක් අතරට ගෙන යෑමයි. මේ කාරිය අද හැඳින්වෙන්නේ 'ජන සන්නිවේදනය' යන නමිනි. ජනසන්නිවේදනය පෝස්ටරය, චිත්‍රපටය, පොත් වැනි විවිධ මාර්ගවලට 'ජනමාධ්‍ය' යන නම ව්‍යවහාර වේ.**

I ඉහත ඡේදය සඳහන් පාඩමේ නම කුමක්ද?

II ඡේදයේ සඳහන් ආකාරයට ජන සන්නිවේදනය යනු කුමක්ද?

III මෙහි දැක්වෙන ජන සන්නිවේදන මාධ්‍ය 2ක් නම් කරන්න.

IV ඡේදයේ සඳහන් නොවන වෙනත් ජන සන්නිවේදන මාධ්‍ය 2ක් නම් කරන්න.

V පහත දැක්වෙන වචන වලට ඡේදයේ දී ඇති වචන ලියන්න.

- හෙළ
- නිරිඳු
- පුස්තක
- රේඩියෝව

(ලකුණු 10)

4. මේ දිනවල පවත්නා අධික වර්ෂාව නිසා ඔබ ප්‍රදේශයේ පැතිර යන ඩෙංගු උවදුර මර්දනය කිරීම සඳහා පියවර ගන්නා ලෙස ඉල්ලමින් ප්‍රදේශයේ මහජන පරීක්ෂකතුමා වෙත යවන ලිපිය සකස් කරන්න.

නැතහොත්

ඔබ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගී වන ලෙස ඉල්ලමින් ආරාධිතයන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු 10)

5. පහත ප්‍රකාශ ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | පාඩමේ නම | කා විසින් කියනලද්දක්ද | කාහට කියන ලද්දක්ද |
|---|---|---|---|
| ''හොඳයි මම මිත් ගැලවෙන විදිහක් කියන්නම්'' | | | |
| ''අයියේ, තේ වලට නේද රතු ගඟුල කියන්නේ?'' | | | |
| ''ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව'' | | | |
| ''මම ලොකු උනාම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා'' | | | |
| ''අනේ කමක් නෑ හාමිනේ පුංචි අයගේ ආසාවනේ හා! හා!! හා!!! ගන්න ගන්න '' | | | |

(ලකුණු 10)

6. කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**උදව්වක් වශයෙන්**

**කිසිවක් නොකළ කෙනෙකුට**

**කරන උපකාරය**

**අහසටත් පොළවටත් නොසමයි.**

I මෙම කවිය උපුටාගත් කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න.

II එම කාව්‍ය ග්‍රන්ථය රචනා කළ කතුවරයා නම් කරන්න.

III කවියේ සඳහන් මූර්ධජ අක්ෂර සහිත වචන දෙකක් ලියන්න.

IV මෙහි ඇති විරුද්ධාර්ථ පද දෙක මොනවාද?

V කවියෙන් කියැවෙන අර්ථය කෙටියේ ලියන්න.

**(ලකුණු 10)**

## පිළිතුරු පත්‍රය

### 1 කොටස

1. ඉහේ මලක් පිපුණා
2. කුකුලා අතින් අරගෙන
3. මිරිස්
4. 42කි
5. ළමයා
6. හකුරුය
7. ඉරමත්
8. උපාසිකාව
9. වෛද්‍යවරු
10. කරන්නීය
11. දිස්වෙයි
12. දිවාකර
13. ශිෂ්‍යයා
14. පූර්වක්‍රියා
15. මිශ්‍ර ක්‍රියා
16. රතුරෝස
17. චන්ද්‍රරත්න මානවසිංහ මහතා
18. ගුරුවරුන්
19. සෝමලතා සුබසිංහ මහත්මිය
20. සමන්

### 2 කොටස

1. සුදුසු පිළිතුරු බලා ලකුණු ලබා දෙන්න.
2. රචනය බලා ලකුණු ලබා දෙන්න.
3. I දුං දුමටයි අඟුරු මටයි.
   II යම්කිසි සිද්ධියක් විශාල පිරිසක් අතරට ලෙන යාම
   III පෝස්ටරය, චිත්‍රපටය, පොත්
   IV රූපවාහිනිය, දුරකතනය, සඟරා, පුවත්පත් ආදිය
   V සිංහල
      රජු
      පොත්
      ගුවන්විදුලි

4. පිළිතුරු බලා ලකුණු ලබා දෙන්න

5.

| ප්‍රකාශය | පාඩමේ නම | කා විසින් කියනලද්දක්ද | කාහට කියන ලද්දක්ද |
|---|---|---|---|
| ''හොඳයි මම මින් ගැලවෙන විදිහක් කියන්නම්" | ගොවි බිරියගේ නුවණ | ගොවි බිරිඳ | ගොවියාට |
| ''අයියේ, තේ වලට නේද රතු ගඟුල කියන්නේ?" | ඔයි රයිරේ ඔයි රාමා | අනුරාධ | සිරිමල්ට |
| ''ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව" | තිලමුට්ඨි ජාතකය | මහලු ස්ත්‍රිය | දිසාපාමොක් ආචාර්යතුමාට |
| ''මම ලොකු උනාම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා" | කතාබහට සංයමයක් | ටොට්ටෝ චං | මවට |
| ''අනේ කමක් නෑ හාමිනේ පුංචි අයගේ ආසාවනේ හා! හා!! හා!!! ගන්න ගන්න " | තොප්පි වෙළෙන්දා | වෙළෙන්දා | ළමයාගේ මවට |

6. I තිරික්කුරල්

II ගොරොක්ගොඩ මිසිහාමි

III නොකළ, පොළවටත්

IV අහස පොළව

V තමාට උපකාරයක් නොකළ කෙනෙකුට කරන උදව්ව අහසටත් පොළවටත් සමකල නොහැකිය. ඊටත් වඩා වටින්නේය.